**මූලික සමාජ සේවා ඉලක්ක මතුවන ප්‍රදේශ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2014**

---

මූලික සමාජ සේවා ඉලක්ක මතුවන ප්‍රදේශ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රජය සහ අන්තර්ජාතික සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය අතර 2012 මාර්තු 28 දින එළඹි අංක එස්එල්පී - 105 දරන ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 4 (6) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ණය ගිවිසුමට අනුව මූලික සමාජ සේවා ඉලක්ක මතුවන ප්‍රදේශ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වන අතර සෞඛ්‍ය අමාත්‍යාංශය සහ නැගෙනහිර, වයඹ, මධ්‍යම සහ සබරගමුව ප්‍රාදේශීය සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. සෞඛ්‍ය හා ඖෂධ වැඩපිළිවෙල වැඩි දියුණු කිරීම සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව හා ද්විතීය මට්ටමේ රෝහල්වල පහසුකම් හා උපකරණ වැඩි දියුණු කිරීම තුළින් අත්‍යවශ්‍ය බෙහෙත් නිෂ්පාදන ධාරිතාව සවිබල ගැන්වීම සහ බෝ නොවන රෝග කළමනාකරණය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය ජපන් යෙන් මිලියන 4,760 ක වටිනාකමට සමාන රු. මිලියන 6,332 ක් වන අතර ඉන් ජපන් යෙන් මිලියන 3,935 ක වටිනාකමට සමාන රු. මිලියන 5,155 ක් අන්තර්ජාතික සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය විසින් මූල්‍යායනය කිරීමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජූලි 23 දින ආරම්භ කළ අතර 2019 ජූලි 23 දිනට අවසන් කිරීමට නියමිත විය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම

පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ දී සිදු කරන ලද එකතුව රු. 98,469,221 ක සෘජු ගෙවීම් ගිණුම්ගත කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යායනය හා සමාලෝචිත වර්ෂය තුළ දී අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල් උපයෝජනය හා 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යායනය කිරීමට එකඟ වූ වටිනාකම | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ ප්‍රතිපාදන | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | ජපන් යෙන් (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | ජපන් යෙන් (මිලියන) | රු. (මිලියන) | ජපන් යෙන් (මිලියන) | රු. (මිලියන) |
| අ.සං. ජ.නි | 3,935 | 5,155 | 1,703 | 787 | 1,004 | 1,035 | 1,326 |
| ශ්‍රී.ලං.ර | 825 | 1,177 | 314 | 142 | 203 | 145 | 238 |
| එකතුව | 4,760 | 6,332 | 2,017 | 929 | 1,207 | 1,180 | 1,564 |

විය පැහැදම් උපලේඛනයට අනුව, මුළු අරමුදල් වටිනාකම රු. මිලියන 5,155 කට සමාන ජපාන යෙන් මිලියන 3,935 ක් 2012 සිට 2019 වර්ෂය දක්වා වසර හයක් තුළ උපයෝජනය කිරීමට අපේක්ෂා කළ අතර 2014 වර්ෂය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් ව්‍යාපෘතිය වෙත රු. මිලියන 1,703 ක් අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදනය කර තිබුණි. එයින් රු. මිලියන 1,326 කට සමාන ජපාන යෙන් මිලියන 1,035 ක් ව්‍යාපෘතිය විසින් 2014 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි. පෙර වර්ෂවල වාර්තා වී ඇති අරමුදල් භාවිතයේ අඩු ප්‍රගතිය මෙමගින් පෙන්නුම් කෙරේ.

### 3.2 භෞතික කාර්යසාධනය

ක්‍රියාකාරී සැලැස්මට අනුව, කුලවන්චිකුඩි, වරකාපොල හා තෙල්දෙණිය රෝහල්වල ඉදිකිරීම් වැඩවල 2014 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත ප්‍රගතිය පිළිවෙලින් සියයට 56, සියයට 67 සහ සියයට 48 විය. 2014 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත මට්ටමට වඩා අඩු තත්‍ය භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 41, සියයට 39 සහ සියයට 36 ක්ව පැවති බව නිරීක්ෂණය විය.

### 3.3 මූල්‍ය පාලනයේ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 756 හි කොන්දේසි ප්‍රකාරව, වටිනාකම රු. 3,838,048 ක් වූ ව්‍යාපෘතියේ වත්කම්වල පැවැත්ම සත්‍යාපනය කළ හැකිවන පරිදි සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ආ) නියමිත කාල පරිච්ඡේදය තුළ ප්‍රතිපාදිත සම්පත් භාවිතයෙන් ව්‍යාපෘති අරමුණු සපුරාගැනීම තහවුරු කරගැනීමට මාසික, කාර්තුමය, අර්ධ වාර්ෂික ලෙස සමස්ථ ව්‍යාපෘති කාලය ආවරණය වන පරිදි වගකීම් සහිතව භෞතික හා මූල්‍ය ඉලක්ක උද්දීපනය වන පරිදි පුළුල් විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතුය. ව්‍යාපෘතිය විසින් එවැනි සැලැස්මක් සකස් කර නොතිබුණි.